# විද්‍යුත් බැංකුකරණයට ග්‍රාමීය ජනතාවගේ අවධානය යොමුවීම අවම වීම කෙරෙහි බලපාන සමාජ-ආර්ථික සාධක

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේහි හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නෙළුව වසමෙහි බැංකු ගනුදෙනුකරුවන් ආශ්‍රිත ව

*අයි. ඒ. පී .කුමාරී[1]*

වර්තමාන ලෝකය තාක්ෂණය මත පදනම් වූ තරඟකාරී ලෝකයකි. මේ නිසා මිනිසුන්ගේ ජීවන තත්ත්වය පවා පෙර පැවති තත්ත්වයට වඩා මහත් සේ වෙනස් ය. මෙම තාක්ෂණයේ දියුණුවත් සමඟ කරළියට පැමිණි ගෝලීයකරණය යන සංකල්පය යටතේ ඉදිරිපත් වන විද්‍යුත් බැංකුකරණය යන සංකල්පය වර්තමානය වන විට ලෝකයේ රටවල් බොහෝමයක් වැලඳගත් සංකල්පයකි. මෙම සංකල්පය ලෝකයට සාපේක්ෂ ව ලංකාවේ ප්‍රචලිතවීමේ තත්ත්වය තවමත් දුර්වල මට්ටමක පවතී. එනම් මෙය නාගරික ජනතාව අතර හා ග්‍රාමීය ජනතාව අතර පැතිර යාම ගත් විට ග්‍රාමීය ජනයා විද්‍යුත් බැංකුකරණය කෙරෙහි අවම මුසු වීමක් දක්වන බවක් පෙනී යයි. එම නිසා ග්‍රාමීය ජනතාවගේ අවධානය යොමුවීම අවම වීම කෙරෙහි බලපාන සමාජ - ආර්ථික සාධක ලංකා බැංකුව, මහජන බැංකුව හා සම්පත් බැංකුව යන බැංකු අතරින් විද්‍යුත් බැංකුකරණය පාරිභෝගිකයන් සම්මත කර ගැනීමට බලපාන සාධක සොයා ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලිය භාවිත කරන ලදි. මෙම පර්යේෂණයේ නියැදිය ලෙස, ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේහි හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නෙළුව වසමෙහි සිටින ලංකා බැංකුව, මහජන බැංකුව හා සම්පත් බැංකුව යන ප්‍රධාන බැංකු තුනේ ගණුදෙනුකරුවෝ 160 දෙනෙක් තෝරා ගනු ලැබූහ. මෙම පරීක්ෂණය සඳහා ද්විතීයක දත්ත ද භාවිත වේ. ලංකා බැංකුව, මහජන බැංකුව හා සම්පත් බැංකුව යන බැංකු අතර ප්‍රකාශිත දත්ත, අන්තර්ජාල මූලාශ්‍රය විටෙක දත්ත ක්‍රමය ලෙස භාවිත කරන ලදි. පාරිභෝගිකයාගේ ආකල්ප බලපෑම විද්‍යුත් බැංකුකරණය අනුගමනයට ඇති ධන බලපෑම, තාක්ෂණික අවබෝධය පිළිබඳ ධනාත්මක බලපෑම, සංජානනය හැසිරීම් කෙරෙහි ඇති ධනාත්මක බලපෑම, පාරිභෝගිකයාගේ අධ්‍යාපනික මට්ටම කෙරෙහි ඇති ධන බැලපෑම යන විචල්‍යයන් මෙහි දී භාවිත කර තිබේ. විද්‍යුත් බැංකුරණය පාරිභෝගිකයන් විසින් සම්මත කර ගැනීමට බලපාන සාධකවල බලපෑම තක්සේරු කිරීම සඳහා අධ්‍යයනය බහු ප්‍රතිගාමී විශ්ලේෂණයක් භාවිත විණි. මෙම පරීක්ෂණයේ විශ්ලේෂණ මෙවලම් ලෙස SPSS මෘදුකාංගය භාවිත කර තිබේ. ප්‍රතිගාමී විශ්ලේෂණයට අනුව අධ්‍යයනයෙන් හෙළි වන්නේ, පාරිභෝගිකයාගේ ආකල්ප, විෂය සම්මතයන් සහ සංජානනීය හැසිරීම් විද්‍යුත් බැංකුකරණය භාවිතයට ධනාත්මක ලෙස බලපාන බවයි. නිර්දේශය වන්නේ බැංකුව ඔවුන්ගේ අලෙවිකරණ වැඩසටහන හරහා විද්‍යුත් බැංකුකරණය භාවිත කිරීමට පවතින බිය නැති කිරීමට, සේවාව ලබාගන්නා අතරතුර දී යම් කිසි ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදු වේ දැයි පවතින බිය නැති කිරීම, සාම්ප්‍රදායික ව හුරු වී සිටි බැංකුකරණ සම්ප්‍රදායෙන් වෙන් වීමට ඇති අකමැත්ත නැති කරවීම, ගිණුමෙහි ස්වභාවය අනුව ලබා ගත හැකි මුදල සීමා කර තිබීම නිසා අවශ්‍යතා සපුරා ගැනීමට බාධාව නැති කිරීමට අවශ්‍ය පියවර ගැනීම යන කරුණු ආමන්ත්‍රණය කළ යුතු බවයි. බැංකුව ඔවුන්ගේ විද්‍යුත් බැංකුකරණ වෙළෙඳපොළ අවකාශය වැඩි කරනු ඇති අතර ජනතාවට විද්‍යුත් බැංකු නිෂ්පාදන පරිභෝජනය කිරීමට ද හැකියාව ලැබේ.

***ප්‍රමුඛ පද:*** අන්තර්ජාල බැංකුකරණය, ගණුදෙනුකරුවෝ, ග්‍රාමීය ජනතාව

---

[1] ආර්ථික විද්‍යා අධ්‍යන අංශය , සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය